# “සංගීතාත්මය” සමඟ දර්ශන රුවන්



“සංගීතාත්මය” සමඟ අප හමුවන්නේ දර්ශන රුවන්... අපගේ සංගීත ක්ෂේත්‍රයේ කලින් කල ඇතිවන පසුබෑම්වලින් නැවත නැවතත් හිස ඔසවන්නට විටින් විට තරුණ සංගීතවේදීන් ඉස්මතු වේ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ රජ රට සේවයේ බිහි වූ එවන් සංගීත ශිල්පීන් අතරට මෑතකදී එක් වූ තවත් යෞවනයෙකි දර්ශන රුවන් දිසානායක සංගීතවේදියා.

සුනිල් එදිරිසිංහයන් ගැයූ “මේ තරම් සියුමැලි ද කළු ගල්” ගීතයේ සංගීතය නිර්මාණයෙන් රසිකයින් හඳුනාගත් දර්ශන, ජයන්ත චන්ද්‍රසිරි සිනමා අධ්‍යක්ෂවරයාගේ “සමනළ සංධ්වනිය” චිත්‍රපටය වෙනුවෙන් සංගීත අධ්‍යක්ෂණය කරමින් මෑතකදී රසිකයන්ට වඩාත් සමීප වූවා. චිත්‍රපටයේ විශාරද අමරසිරි පීරිස් ගායන ශිල්පියාණන් ගැයූ “මට මගේ නොවන මගේම ආදරයක් තිබුණා” ගීය වෙනම ආකාරයකින් රසිකයන් වැළඳගැනීම ඊට එක හේතුවක්.



සිසිර දිසානායක

ගීතයට එහා යන සංගීතයක් වෙනුවෙන් යන ගමනේ දී දර්ශනගේ මියැසි රටාවලට විශාරද අමරසිරි පීරිස් ගායනයෙන් දායකවූ “ගඟ ගලා යාදෙන්” නමැති ගී 19කින් යුත් එකතුව කඩඉම් ලකුණකි. වයලීන පවුලේ මෙවලම්, බටහිර වාද්‍ය භාණ්ඩ මෙන්ම ඇතැම් ගී සඳහා හෙළ වාද්‍ය භාණ්ඩ යොදාගෙන කළ ඒ නිර්මාණ එකතුව සැබැවින් ම අනෙක් සංගීත තැටි අතරින් වෙනස් වූවක්. ඊට අමතරව අමරසිරි පීරිස් ශූරීන්, ප්‍රදීපා ධර්මදාස ගායන ශිල්පිනිය මූලිකව පනහක පමණ ගායන වෘන්දයකින් සමන්විතව ඉදිරිපත් කළ “තුන්කල් බෞද්ධ සංගීත සජ්ජායනය” නම් වූ කැන්ටාටාව විනාඩි 50ක් පුරා ගායනය වෙමින් එය ලොව දීර්ඝතම කැන්ටාටාව බවට පත් වුණ බවයි දැනගැන්මට ලැබුණේ. දර්ශන, ඉතිහාසය කියවන්නෙක්. ඔහු මේ කැන්ටාටාව අපේ ජන සංගීතයත්, බෞද්ධ දර්ශනයේ එන චක්කවත්ති සිහනාද සූත්‍රයත්, ආතර් සී ක්ලාක් විද්වතාණන්ගේ මත සහ මහා වංශය, පූජාවලිය, රාජාවලිය හා අනාගත වංශයේ එන කරුණුත් සැලකිල්ලට ගනිමින් නිර්මාණය කළ බවයි මව්බිමේ පුවත්පත් සාකච්ඡාවක් සඳහා ඔහු පවසා තිබුණේ.

දර්ශන රුවන් දිසානායකයන්ගේ මියැසි නිමැවුම් විඳීමට මෙල්බර්න් රසිකයන්ට සැප්තැම්බර් මස 07 ද අවස්ථාවක් ලැබෙයි. ඒ “සංගීතාත්මය” ප්‍රසංගය තුලින්. ඒ වෙනුවෙන් යමක් සාකච්ඡා කිරීමට අප දර්ශනව දුරකථනයෙන් සම්බන්ධ කර ගත්තා. මුලින්ම ඔහු සාකච්ඡාව ඇරඹුයේ තමන් ගේ සංගීත ක්‍රමවේදයන්ට මූලික වූ අදහස් ඉදිරිපත් කරමින්.

“ඇත්තටම මගේ මූලික අරමුණ වන්නේ අපේ දේවල් සමඟ ලෝක සංගීතය මිශ්‍ර කර ගැනීම. බටහිර සංගීත ආරයේ එන “ඔපෙරා” “සිම්ෆනි” “ කැන්ටාටා” වගේ දේ මං ඇසුරු කරනවා. “සමනළ සංධ්වනිය” චිත්‍රපටය ඇරඹෙන්නේත් අපේ නෙළුම් කවි නාද මාලා ඇසුරින් කරපු එවැනි නිර්මාණයකින්.”

“අපේ ඉතිහාසය ගැන සොයාගෙන යනකොට තේරෙන දෙයක් තමයි එදා අපට තිබුණ තැන ගැන හරි අවබෝධයක් අද අපිට තියනවාද කියන එක. අපට ඉතිහාසය තුලින් ගොඩ ගන්නට බැරි යම් තොරතුරු ටිකක් තියෙනවා. හොඳින් අධ්‍යනය කිරීමෙන් මට ඒ සමහරක් දේ සොයාගන්න පුළුවන් වුණා. අපේ ජන සංගීතයේ සැඟවී ගිය කොටස් ගැන මට දැණුනා. ඉතින් ඒ දේවල් ස්පර්ශ කරමින් රසිකයා ගීත අහලා විඳින දේට වඩා එහා ගිය වින්දනයක් ලබා දෙන්න මං උත්සහ කළා.”

“ගීතය සංගීතයේ අග්‍ර ඵලය නොවෙයි. යුරෝපා පුනරුදයත් එක්කම ඔය මොසාඩ්ලා වගේ විශිෂ්ඨ ගණයේ සංගීතවේදීන් ගීතයෙන් එහා ගිය නාද කාව්‍ය නැත්නම් “සිම්ෆනි” වගේ දේවල් නිර්මාණය කරලා ලෝකයට දායද කළා. ඇත්තටම ඒවා භාෂාව ඉක්මවා ගිය හැඟීම් ප්‍රකාශන. ඉතින් අපේ රටෙත් බොහෝ දියුණු නාද මාලා තියෙනවා ජන ශ්‍රැතියේ. ඒවයින් ප්‍රයෝජන අරගෙන ලෝක සංගීතයට මිශ්‍ර කරගැනීමෙන් අපිට බොහෝ දේවල් කරන්නට පුළුවන්...” දර්ශන තමන්ගේ අදහස් දැක්වූවා.

ඉතා අඩු වයසෙන් රජ රට ගුවන් විදුලි සේවයට ගිය දර්ශන ස්වෝත්සහයෙන් ම බටහිර හා ජන සංගීතය උගෙන ඉදිරියට ආ තරුණයෙකි. අවුරුදු අටක අනුරාධපුරයේ සේවා කාලය ඔහුට විශ්ව විද්‍යාලයක් වුණ බවයි ඔහුගේ අදහස. තමන්ගේ සංගීතමය අධ්‍යාපනයේ දී වෙසෙසින් ම කෘතඥතා පූර්වක ව ඔහු ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්නයන් ව සිහිපත් කරයි. ඔහුගේ නිර්මාණ වලට නිරතුරුව මුහු කරගත් වයලීන වැයීම පිළිබඳව ඩී. ඩී. ගුණසේන, ආනන්ද දාබරේ, රුක්ෂාන් ගුණවර්ධන යන ශිල්පීන් ඉහලින් ම අගයයි. ආසියාතික නාද ලොවට පෙන්විය හැකි- වාදකයකු ලෙසින් ඔහු ඩී. ඩී. ගුණසේන ප්‍රවීන වයලීන් වාද්‍ය ශිල්පියාණන්ව නම් කරයි. සමුගැන්මට පෙර “සංගීතාත්මය” නම් වූ නැවුම් අත්දැකීම විඳගන්නට සැමටම ආරාධනා කළ දර්ශන, නීල් ගමගේ සොයුරා ඇතුළු ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා සංස්කෘතික පදනමේ සංවිධායක මණ්ඩලයට ස්තුතිවන්ත වුණා.

“සංගීතාත්මය” ප්‍රසංගය ඔබට ඉදිරිපත් කරන්නේ ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා සංස්කෘතික පදනම විසිනි. මෙම ප්‍රසංගය ඔවුන්ගේ තවත් එක් කඩඉම් වැඩසටහනක් වන අතර, මේ තුලින් ඔවුන් ඉදිරියට තවත් වැඩසටහන් බොහොමයක් ඔබට ගෙන ඒමට බලාපොරොත්තු වෙයි. ඊට අමතරව දර්ශන සමඟ වැඩමුළු කීපයක් පැවැත්වීමටද බලාපොරොත්තු වේ. මේ සඳහා දරුවන් ඇතුළු සංගීතය පිළිබඳව කැමැත්තක් ඇති සියළු දෙනාට ආරාධනා කරන අතර, මේ තුලින් ඔවුන්ගේ කුසලතා තව තවත් වැඩි දියුණු කරගැනීමට මහත් රුකුලක් වේ. අප හා අදහස් දැක්වීම පිළිබඳව පාඨකයින් වෙනුවෙන් ස්තූතිවන්ත වීමෙන් අනතුරුව දර්ශන පිළිබඳව ක්ෂේත්‍රයේ විද්වතුන් කීප දෙනෙකු දක්වා තබුණු අදහස් කිහිපයක් වෙත යොමු වීමට සිතුවා.

“මම ජීවිතයේ නොලබපු වින්දනයක් ලබනවා මේ දර්ශන රුවන් දිසානායකගේ අසිරිමත් සංගීතයෙන්, ඒක ශ්‍රව්‍ය කාව්‍යයක්, ඒ කියන්නෙ සිම්ෆනියක්...”
**- අචාර්ය පණ්ඩිත් අමරදේව**

“දර්ශනව මම දැන හඳුනාගත්තේ මීට අවුරුදු 10කට විතර පෙරදියි. ඒ ගීතයක් මා ලවා කරවාගන්න ඇවිත්. ඉතින් ඒ ස්වර සටහන් දිහා බලපුවාම ඒවායේ යම්කිසි පරිපූර්ණත්වයක් තිබුණා. ඉතින් මා තුළ ඔහු පිළිබඳ කිසියම් විශ්වාසයක් ගොඩනැගුණා. උදාහරණයක් විදියට ඔහු පොළොන්නරුවේ ගල් විහාරය ඉදිරිපිට විශාල පිරිසක් ඉදිරියේ කළේ විශිෂ්ඨ නිර්මාණය කියන්න පුළුවන්. ඉන් පසු ඔහු හොඳින් අඳුනාගත්තා”
**- විශාරද අමරසිරි පීරිස්**

“අපේ රටේ ඉතාම දක්ෂ සංගීතඥයින් ඉන්නවා; තර්කයක් නෑ. හැබැයි ඒ දක්ෂකම් එක්ක තියෙනවා නේද අපට හුරු විදියක් ඇති වෙන ගතියක් එතෙන්දී මගේ මේ ස්නායු වලට දැනෙන දේට හරියටම ගැලපෙන එක්කෙනෙක් හොය හොයා හිටියා මම. ඔහු හමුවුණා. ඒ දර්ශන. ඔහු සමනල සංධ්වනියට විශිෂ්ඨ ආකාරයෙන් සංගීතය නිර්මාණය කළා...”
**- ප්‍රවීණ චිත්‍රපට හා ටෙලිනාට්‍ය අධ්‍යක්ෂ ජයන්ත චන්ද්‍රසිරි**

“මගේ අවුරුදු 27ක සේවා කාලයේදී විවිධ දක්ෂතා තියෙන විවිධ සංගීත අධ්‍යක්ෂවරුන් දැකලා තියෙනවා. මම දර්ශන රුවන් දිසානායකගේ අතිශය සුවිශේෂී තත්ත්වයක් දකිනවා, මෙන්න මෙහෙම; ඔහුගේ තියෙනවා රමණීයත්වය හා අපූර්වත්වය පිළිබඳව හරිම ගැඹුරු ආකල්පයන් සංගීතමය පැත්තෙන්. වචනයකට යා හැකි උපරිම දුර ගෙවා අවසන් වෙන තැනදී සංගීතය ආරම්භ වෙනවා කියන ලෝක ප්‍රකට විශිෂ්ඨ සිද්ධාන්තය නැත්තනම් මතය තුළ ඔහු ඉතාම නිවැරදිව පෙනී සිටිනවා. අපි හිතන්නේ නැති සංගීත භාණ්ඩ සංයෝජනයක් තුල අපි මහා මවිතයට පත් කරවන අදහසක් ප්‍රකාශ කරන්න ඔහුට පුළුවන්.”
**- මහාචාර්ය මහානාම වික්‍රමසිංහ - සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය**

වැඩි විස්තර සඳහා - නීල් 0438 651 238; උපේඛා 0404 703 825


**Tutoring**

**22 years of experience in tutoring in Melbourne with Proven Results.......!**

*Coaching for*
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: *Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics*
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary

- Scholarship and Selective School exams
*Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.*

**Small groups - up to 4 students.....!**
**Individual classes on request**

**Neranjana Kudaligama**
**0408 356 821**
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

**Hemantha Devendra**
**0409 854 597**
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)


## කුසුමා ගුණවර්ධන පාර්ලිමේන්තු කතා එළි දැක්වෙයි



බොරළුගොඩ සිංහයා නමින් ඉතිහාසයට එක් වු පිල්ප් ගුණවර්ධන මහතාගේ බිරිඳවූ කුසුමා ගුණවර්ධන මහත්මිය පාර්ලිමේන්තුවේ කළ කතා එකතුව ඇතුළත් පුස්තකය එළි දැක්වීම පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම් සෑම් විජේසිංහ මහතාගේ නිවසේදී පැවැත්විණි.

1912 මැයි 26 වැනිදා මැද කැටියේ උපන් කුසුමා 1939 දි පිලිප් හා විවාහ වීය සිය සැමියා සමග සමාජවාදී ව්‍යාසපාරයට එක්වූ ඇය ඔහු සමග සිර බත්ද කෑවාය

ප්‍රවීණ මාධ්‍යවේදී එස් පියසේන මහතා මේ පොතේ සංස්කාරකවරයාය



මරදාන එස් ගොඩගේ සමාගමෙන් එළි දැක්වූ පුස්තකයේ පළමු පිටත සිරිසුමන ගොඩගේ මහතා මාධ්‍යවේදී එස් පියසේන මහතා වෙත මෙහිදී පිළිගැන්විණි.